## සලාදයෙන් ස්වයං පෝෂිතවීම

ලෝකයේ වෙසෙන වැඩිදෙනෙක් වැඩියෙන්ම කැමති පුළුවන් තරම් ලොකු ලොකු දේවල් කරන්නනෙ. පොඩි දෙයක් කරල ලැබෙන ප්‍රසිද්ධියට වඩා ලොකු දෙයක් කළවිට ලොකු ප්‍රසිද්ධියක් ලැබෙන බවත් සත්‍යයක්.

ඒ නිසා හැම කෙනෙකුගේම අවදානය දිනා ගන්න නම්, ලොකු දෙයක් මිසක් පොඩි දේවල් කරලා වැඩක් නැහැ.

පසුගියදා ස්පාඤ්ඤයේ දකුණු පළාතට අයත් ඇල්මෙරියා ප්‍රාන්තයේ පිහිටි පුල්පි නගරයේදී පිරිසක් එකතු වෙලා ලොකු වැඩක් කරන්න පටන් ගත්තා.

මේ පිරිසට අවශ්‍ය වෙලා තිබුණේ ලෝකයේ විශාලම සලාදය හදන්න.



ඉතිං මේ අය එම සලාදය හදන්න එළවලු කිලෝග්‍රෑම් 6700 ක් ප්‍රයෝජනයට ගත්තා. එය රාත්තල් වලින් නම් 14,740 ක්.

වැඩේට සහභාගි වූ කෝකියන් සංඛ්‍යාව 20 ක්. මේ අයට සලාද කොළ, තක්කාලි හා ලූණු කපල ඒවා ගම්මිරිස් කුඩු සමග මිශ්‍ර කර ගන්න විතරක් පැය 3 කට වැඩි කාලයක් ගතවුණා.

ඔවුන් මෙම සලාදය පිළියෙල කිරීම සඳහා තෝරාගෙන තිබුණේ අඩි 59 ක් දිග අඩි 15 අඟල් 7 ක් පළල නැව් භාණ්ඩ අසුරන කන්ටේනරයකුයි.

ගිනස් වාර්තාවක් පිහිටුවීමේ අදහසින් ආරම්භ කළ මේ කටයුත්තට නායකත්වය දී තිබුනේ පුල්පි නගරයේ ක්‍රියාත්මක වෙළෙඳ සංගමයේ ප්‍රධානියා වූ ලොරෙන්සෝ නවාරෝ විසිනුයි.

කොහොම නමුත් ගිනස් වාර්තා විනිසුරුවරයෙකු පවා එංගලන්තයේ සිට පැමිණ මේ අවස්ථාවට සහභාගි වී සිටි බව ස්පාඤ්ඤ මාධ්‍ය ඔස්සේ වාර්තා වුණා.

සිය උත්සාහය සාර්ථකවීමෙන් පසු ඊට දායක වූ හැමෝටම ප්‍රසාදය පල කළ නවාරෝ ආරම්භයේ සිට අවසානය දක්වාම මේ කටයුත්ත සාර්ථකව අවසන් කරන්නට හැම කෙනෙකුගේම උපකාරය ලැබුණු බව ප්‍රකාශ කරනු ලැබුවා.

ඔවුන් විසින් පිළියෙළ කරණ ලද සලාදය පසුව පුල්පි නගරයේ ප්‍රධාන පෙළේ ආපන ශාලාවලට නොමිලයේ බෙදා දුන් නවාරෝ ඒවා ඔවුන්ගේ ගණුදෙනුකරුවන්ට නොමිලයේ ලබාදෙන ලෙසින් ඉල්ලීමක්ද කර තිබුණා.

## නීතියේ පුංචි සිදුරකින් රිංගූ විශාල බ්‍රෙසියරය

ලෝකයේ වැඩිම ජනගහණයක් වාසය කරණ රට චීනයයි. ඒ වගේම එය සමාජවාදී කොමියුනිස්ට් පාලනයක් සහිත රටක්.

පසුගියදා එරට බලධාරීන් රූපවාහිනී විකාශණ ආයතනවලට බලපාන පරිදි කාමුක හැඟීම් අවුස-'සන ශබ්ද සහිත වැඩසටහන් ප්‍රචාරය කිරීම තහනම් කරමින් නව නීතියක් පනවනු ලැබුවා.

ඒ වගේම බ්‍රෙසියර් හා යට ඇඳුම් සහිතව සිරුරේ හැඩය පැහැදිලිව පෙනෙන නිරූපන සහිත වෙළෙඳ දැන්වීම් රූපවාහිණිය ඔස්සේ ප්‍රචාරය කිරීමද දැන් චීනයේ තහනම්. එපමණකින්ද නො-නැවතුණු චීන ගුවන්විදුලිය, රූපවාහිණී හා චිත්‍රපට පාලනාධිකාරිය ලිංගික උපකරණ හා ඖෂධ පිළිබඳ දැන්වීම් සඳහා ජනප්‍රිය හෝ විශේෂඥ පුද්ගලයින් සහභාගි විය හැක්කේ එම නිෂ්පාදන පිළිබඳව ඔවුන්ට සහතික විය හැකිනම් පමණක්ය යනුවෙන් ද නව නීතියක් පනවනු ලැබ ඇත.
මෙම නීති රීති පනවමින් චීන රජය සුදානම් වන්-න් එරට ප්‍රධාන දේශපාලන ප්‍රවාහය වන චීන කොමියුනිස්ට් පක්ෂයේ සංවත්සර මහා සභා රැස්වීම පැවැත්වීම සඳහාය.

වැඩි වශයෙන් ජනතාව රූපවාහිණිය නරඹන කාල වෙලාවන් හිදී ලිංගික සැත්කම් වැනි සත්‍ය සිදුවීම් පවා පෙන්වීම චීන බලධාරීන් තහනම් කර ඇති බව ආරංචියි.



ඔවුන් මේ සේරම නීතිරීති ගුවන් විදුලියට, රූපවාහිනියට හා චිත්‍රපටවලට පනවලා සාර්ථක ප්‍රතිඵල බලාපොරොත්තු වුණාට ඒවා පනවපු දින පසු දිනම නැගෙනහිර චීනයේ නැන්ජින්ග් නගරයේ පවත්වනු ලැබූ 8 වැනි ජියැන්සු අන්තර් ජාතික සළු පිළි ප්‍රදර්ශණය පිළිබඳ විශාල ප්‍රචාරක දැන්වීම් පුවරුව කාන්තා යට ඇඳුමක් වූ බ්‍රෙසියරයක අති විශාල පින්තූරයකින් සරසලා තිබුණා.

පෙර සඳහන් කළ තහනම ඒ දැන්වීම් පුවරුවට බලපාලා තිබුනෙ නැහැ. කාටත් නොපෙනුන පුංචි සිදුරක් නීතියේ තියෙන්න ඇති.

## මාරක හාද්ද

මේක චීන පුවත්පතක පළවී තිබූ තවත් අපූරු පුවතක්. එම පුවතින් කියැවෙන්නේ පෙම්වතිය විසින් තම පෙම්වතා මරා දැමීම සඳහා අනුගමනය කර තිබූ ඉතා දුර්ලභ ක්‍රියාමාර්ගයක් පිළිබඳවයි.

පෙම්වතියගේ නම සියා සින්ෆෙන්ග් එතකොට පෙම්වතා මාවෝ ඇන්ෂෙන්ග් මේ දෙන්නා පෙම්වතුන් ලෙස ඇසුරු කිරීම ආරම්භ කර තිබුණේ බොහෝ කාලයකට පෙර සිටය.

ඉතින් වෙනද වගේම පසුගිය දිනක දෙන්නා මුණ ගැහුණු මොහොතක බොහොම ආදරයෙන් කතාබහ කර කර ඉඳලා තියෙනවා. ඊට පස්සේ දෙන්නට දෙන්න සිප වැළඳ ගන්නත් පටන් ගෙන තිබුණා.

එහෙත් වැඩි වේලාවක් ගත වෙන්න කලින් පෙම්වතා මාවෝ ටිකෙන් ටික අප්‍රාණික වෙමින් සියා සින්ෆෙන්ගෙ ඇඟට බරවුණා. ඒ වනවිටත් මාවෝ මෙලොව හැර ගිහින් තිබුණේ.

කොහොම වුණත් තම පෙම්වතාගේ මරණය සියාට දරාගත නොහැකි වුණා. ඒ නිසා සිදුවූ සියල්ල පසුව ඇය විසින් පාපෝච්චාරණය කර තිබුණා.

ඔවුන් දෙදෙනා දැන හඳුනා ගත් මුල් අවදියේම



වෙනත් කෙනෙකු ගැන නොසිතන බවට දෙන්නට දෙන්න ගිවිස ගෙන සිටියාලු. ඒ අනුව වෙනත් කෙනෙකුට ආදරය කරන්නට දෙන්නගෙන් කව්රු හෝ තීරණය කළහොත් ඔහු හෝ ඇය මිය යා යුතු බවද එම ගිවිසුමට ඇතුළත් වුණා.

මෙහෙම කාලය ගෙවී යද්දී දිනක් මාවෝ තවත් තරුණියක සමග මහා මාර්ගයක කථා කර කර සිටින අයුරු සියා දැක තිබුණා. ඒ මාවෝගේ අලුත් පෙම්වතිය යයි ඇය වරදවා වටහා ගත්තා.

ඒ අනුව තමන් රැවටූ මාවෝ මිය යා යුතු බවට සියා තීරණය කළා. පසුදින ඇය මාවෝ හමුවීමට පැමිණියේ මී පාසානම් සහිත කැප්සූල් එකක්ද රැගෙනය.

දෙදෙනා කථාබහ කරමින් සිට සිප වැළඳ ගන්නා මොහොතේ ඇය ඔහුට නොදැනෙන සේ එම විස සහිත කැප්සූලය කටේ ඔබා ගෙන තිබුණා.

කිසිවක් නොදත් මාවෝ වෙනද වගේම ආදරයෙන් සියා සිප ගත්ත මොහොතකදී කැප්සූලය දියවී ඉන් පිටතට ආ විස මාවෝගේ සිරුරට ඇතුල් වුණා.

මාවෝ - සියා ආදර කථාව මාරක හාද්දකින් අවසන් වුණා.

සීවලි එදිරිවීර








